**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - 2019**

**---------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 හි 110 ඡේදය ප්‍රකාරව, ගනුදෙනුකරුවන් සමඟ එළඹී ගිවිසුම් මගින් ඇති වන ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවද, සංස්ථාව පාර්ශවකරුවෙකු වූ බද්ධ ව්‍යාපාර හා ඖෂධ බෙදාහරින්නන් සමඟ එළඹී ගිවිසුම් මගින් ඇතිවන ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්ති ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොතිබුණි. | ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්තිය ප්‍රමාණවත් ලෙස හා විස්තරාත්මකව ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 හි 22 ඡේදය ප්‍රකාරව, බදු ගැණුම්කරුට භාවිතා කිරීමට අයිතිය ඇති වත්කම සහ බදු වගකීම බද්ධ ආරම්භ වන දිනට හඳුනාගත යුතුය. තවද එම ප්‍රමිතයේ 26 ඡේදය ප්‍රකාරව, බදු ගැණුම්කරු විසින් එදිනට නොගෙවන ලද බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට බදු වගකීම අගය කළ යුතුය. එසේම එම ප්‍රමිතයේ 47 (අ) හා (ආ) ඡේද ප්‍රකාරව, බදු ගැණුම්කරු විසින් භාවිතා කිරීමට අයිතිය ඇති වත්කම සහ බදු වගකීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කිරීම හෝ සටහන්වල හෙළිදරව් කිරීම කළ යුතුය. නමුත් සංස්ථාව පරිහරණය කරනු ලබන රු.මිලියන 4.92 ක්වූ කල්බදු ඉඩම සම්බන්ධයෙන් ප්‍රමිතයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රමිතයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන බව. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 294.82 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම්වල නව තක්සේරු වටිනාකම ගිණුම්ගත කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේදී සිදුකර තිබුණු ගිණුම්කරණ දෝෂයක් නිවැරදි කිරීම සඳහා රු.150,397 ක් පමණක් අමතර කොටස් තොග ගිණුම හර කර ලාභාලාභ ගිණුම බැර කළ යුතුව තිබුණු නමුත් ඒ වෙනුවට රු.මිලියන 2.95 ක් එපරිදි ගිණුම්ගත කර තිබුණි. | අදාළ අයිතමයේ අගය නිසි පරිදි තක්සේරු කිරීමෙන් පසුව ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ඉදිරි වර්ෂයේදී මෙම වරද නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණු ප්‍රාග්ධන ස්වාභාවයේ වියදම් රු.මිලියන 1.28 ක් අයභාර වියදම් ලෙස සලකා ලාභයට එරෙහිව කපාහැර තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය තුළ ඇතුළත් කල්ඉකුත් වූ හා තත්ත්වයෙන් අසමත් තොගයක පිරිවැය රු.මිලියන 3.34 ක් ලාභයට එරෙහිව කපා හැර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී තත්ත්ව පාලන අංශයෙන්, විගණන කමිටුවෙන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබාගැනීමෙන් පසු අදාළ පියවර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.මිලියන | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.මිලියන | වෙනස රු.මිලියන | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| සංස්ථාව විසින් නිෂ්පාදනය කර තිබුණු ඖෂධ අයිතම 13 ක විකුණුම් පිරිවැය. | 34.66 | 35.07 | 0.41 | ගිණුම් පියවන අවස්ථාව වන විට සම්පූර්ණයෙන් යාවත්කාලීන (Complete Update) නොවූ වැඩ ඇණවුම් (Work Oder) ප්‍රමිත පිරිවැයට යාවත්කාලීන කරන බැවින් ඇති වන වෙනස ජර්නල් සටහන් යෙදීම මඟින් තුලනය කරන බව. | වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන නිවැරදි කිරීම් සිදුකළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. මිලියන | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. මිලියන | | | |
| විකුණුම් පිරිවැය | 10.44 | නිවැරදි වැඩපත් හා ජ'නල් සටහන්වලට අදාළ උපයෝගී ලියවිලි | පරිගණක පද්ධතියෙන් ලබා ගන්නා ලද විශ්ලේෂණයන් වල නිවැරදිතාවය තහවුරු කිරිමට manually පරීක්ෂා කිරීමට ඉදිරියේදි කටයුතු කරන බව. | විකුණුම් පිරිවැය වටිනාකම තහවුරු කර ගැනීම සඳහා වන නිවැරදි වැඩපත් (Work Orders) හා ජ'නල් සටහන්වලට අදාළ උපයෝගී ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 06 (2)(අ) වගන්තිය | සේවකයා සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුප හෝ වේතනය මත පදනම්ව සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කළ යුතු වුවද, ඒ වෙනුවට සේවකයාගේ සම්පූර්ණ මාසයක වැටුප පදනම් කර ගෙන සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම ගොස් තිබුණු නිලධාරීන් 05 දෙනෙකු වෙත රු.මිලියන 3.85 ක් වැඩියෙන් පාරිතෝෂික දීමනා ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවීමට කටයුතු කර ඇති බව. | පනතේ වගන්තිවලට අනුකූලව සේවක පාරිතෝෂික වෙන් කිරීම් හා ගෙවීම් සිදු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 102, 103,104 හා 105 | සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 178 ක් සහ නොනිමි ඖෂධ කිලෝග්‍රෑම් 448 ක්, තත්ත්වයෙන් අසමත්වීම හේතුවෙන් දැරීමට සිදුවී තිබුණු අලාභය රු.781,553 ක් වූ නමුත් මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් සිදුකර අලාභයට වගකිව යුතු පාර්ශ්වයන් හඳුනා ගැනීමටත්, අදාළ පරිදි අලාභය අයකර ගැනීමටත්, තොග විධිමත් පරිදි අපහරණය කර තොග පොත්වලින් ඉවත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුව වෙළඳපල වටිනාකමක් නැති තොග ලාභයෙන් කපා හැර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2019 දෙසැම්බර් 31 දින වන විට භාවිතයට ගත නොහැකි පිරිවැය රු.මිලියන 5.89 ක්වූ අමුද්‍රව්‍ය තොග, පිරිවැය රු.මිලියන 6.03 ක්වූ නොනිමි ද්‍රව්‍ය තොග හා මුළු පිරිවැය රු.මිලියන 54.10 ක් හා පොත් අගය ශුන්‍ය වූ ස්ථාවර වත්කම් ඒකක 309 ක් විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කර නොමැති අමුද්‍රව්‍ය විධිමත් පරිදි අපහරණය කිරීමට නියමිත බව, නොනිමි ද්‍රව්‍ය තොග විනාශ කිරීමට අවශ්‍ය මූලික පියවර විගණන කමිටුවට වාර්තා කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරියේදී ඉදිරිපත් කරන බව, පොත් අගය ශුන්‍ය වූ ස්ථාවර වත්කම් විධිමත් | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලෙස අපහරණය කිරීමට කමිටුවක් පත් කර ඇති බව. | |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2019 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.මිලියන 42.34 ක් වූ පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අදාළ චක්‍රලේඛ අනුව, ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට ඉදිරි වර්ෂයේ සිට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වාර්ෂිකව විගණන කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා එක් රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි. | 2019 වර්ෂය සඳහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් අධ්‍යක්ෂවරයෙකු පත් කර නොතිබුණු බව, විගණන කමිටු සභාපතිවරයා භාණ්ඩාගාරය නියෝජනය කරමින් පත් කරන බැවින් විගණන කමිටුව පත් කර ගත නොහැකි වූ බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 10 වැනි වගන්තිය. | එක් නිලධාරියෙකුට ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 කට සීමා කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 45 දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා රු.මිලියන 3.42 ක් ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවීමට කටයුතු කර ඇති බව. | සංස්ථාවට ආවේනික වූ පරිපාලනමය හා පාලන රෙගුලාසි ඇතුළත් කරමින් ආයතන සංග්‍රහයක් පිළියෙල කර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගන්නා තෙක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ගෙවීම් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (උ) | 2009 මාර්තු 09 දිනැති අංක ඩීඑම්එස්/ර්4/10/ 4/090/2 දරන සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඇමතූ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ ඡේද අංක 02-01 | (i) | සංස්ථාවේ විධායක හා විධායක නොවන නිලධාරීන් වෙත දුර ප්‍රමාණය සළකා ප්‍රවාහන දීමනා ගෙවිය යුතු වුවද, දුර ප්‍රමාණය නොසළකා 2009 වර්ෂයේ සිට මාසිකව පිළිවෙලින් රු.4,700 ක හා රු.3,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ සිට අධ්‍යක්ෂක මණ්ඩල තීරණයකට අනුව එම මාසික දීමනාව පිළිවෙලින් රු.8,000 ක් හා රු.6,000 ක් දක්වා වැඩිකර මුදල් ගෙවා තිබුණි. | සංස්ථා සේවකයන් සඳහා ගෙවනු ලබන ප්‍රවාහන දීමනාව හා නිෂ්පාදන දිරි දීමනාව පිළිබඳ සාකච්ඡාවක් ඉල්ලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යැවූ ලිපියට පිළිතුරු ලෙස දිරිදීමනා ගෙවීමේ ක්‍රමවේදයක් සකසා නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලෙසට දන්වා එවා ඇති බව හා දැනට ඒ අනුව කටයුතු කරමින් පවතින බව. | අදාළ අවස්ථාවලදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගෙන මෙවැනි දීමනා ගෙවිය යුතු අතර ගෙවා ඇති දීමනා සම්බන්ධයෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | | (ii) | කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත මාසික නිෂ්පාදන දිරි දීමනාවක් ලෙස රු.4,000 ක් පමණක් ගෙවිය හැකි වුවත්, ඊට අනුකූල නොවන පරිදි 2011 ජූලි 01 දින සිට මාසිකව උපරිමය රු.12,000 කට යටත්ව සමස්ත කාර්ය මණ්ඩලය වෙත නිෂ්පාදන දිරි දීමනා ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී වැඩියෙන් ගෙවා තිබුණු රු.මිලියන 21.49 ක්ද ඇතුළුව 2011 ජූලි සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී මුළු එකතුව රු.මිලියන 102.23 ක් නිෂ්පාදන දිරි දීමනා වැඩියෙන් ගෙවා තිබුණි. | -එම- | -එම- |

## 2. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඖෂධ වර්ග 45 කින් පමණ ඒකක මිලියන 2,000 කට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කරන සංස්ථාව තුළ පිරිවැය පාලන අංශයක් ස්ථාපිත කර නොතිබුණු අතර පිරිවැය ගණකාධිකාරී තනතුරක් හෝ අනුමත කරවා ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් සංස්ථා නිෂ්පාදනවල පිරිවැය මෙන්ම බද්ධ ව්‍යාපාර ගිවිසුම් ප්‍රකාරව දේශීය නිෂ්පාදන ආයතනවලින් මිලදී ගන්නා නිෂ්පාදනවල පිරිවැය පාලනයක් සිදුකළ නොහැකිවී තිබුණි. | පිරිවැය ගණකාධිකාරී තනතුරක් නොමැති වුවත් සංස්ථා නිෂ්පාදන වල පිරිවැය පරීක්ෂා කරනු ලබන්නේ විධායක තනතුරක් දරන නිලධාරීන් විසින් බව, ඉදිරියේදී මේ සඳහා නිලධාරියෙක් බදවා ගැනීමට කටයුතු කරනු ලබන බව. | සංස්ථා නිෂ්පාදන වල පිරිවැය සම්බන්ධ මෙහෙයුම් හා පාලන කටයුතු සඳහා සුදුසු තනතුරක් අනුමත කරවාගෙන බඳවාගත යුතුය. |
| (ආ) | 2018 වර්ෂය තුළදී පිරිවැය රු.මිලියන 1.91 ක් වූ Clopidogrel Bisulphate ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 200 ක් මිලදී ගෙන තිබුණු නමුත් එම අමුද්‍රව්‍ය භාවිතා කර Clopidogrel Bisulphate Tab 75mg ඖෂධය නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කරන නිෂ්පාදන බලපත්‍රය සහ ලියාපදිංචි සහතිකය 2020 ජුනි 10 දින වන විටත් ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් ලබාගැනීමට අපොහොසත්වී තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය සැපයුම් අංශය විසින් ඇණවුම් කර තිබුණු එම ඖෂධ පෙති මිලියන 38 ක් රු.මිලියන 75.56 ක් වැයකර බද්ධ ව්‍යාපාර වෙතින් සපයාගෙන තිබුණි. නමුත් එම ඖෂධවල සංස්ථාවේ ප්‍රමිත නිෂ්පාදන පිරිවැය රු.මිලියන 66.72 ක් පමණක් විය. ඒ අනුව මෙම ඖෂධය සංස්ථාව විසින් නිෂ්පාදනය නොකර බද්ධ ව්‍යාපාර වෙතින් මිලදී ගෙන තිබීම හේතුවෙන් දැරීමට සිදු වී තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 8.84 ක් විය. | මෙම ඖෂධය සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු කිරීමේදී තාක්ෂණික ගැටළු ඇති වූ බැවින් අපේක්ෂා කළ කාල පරිච්ඡේදය ඇතුළත සංවර්ධනය කොට අවසන් කිරීමට නොහැකි වූ බව, දැනට මෙම ඖෂධය ලියාපදිංචිය සඳහා යොමුකර ඇති බව හා මිලදී ගත් අමුද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 200 යොදා ගනිමින් ප්‍රථම වාණිජ මට්ටමේ පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති බව. | සංස්ථාවට වඩාත් වාසිදායක මෙන්ම, අඩු පිරිවැයකට වෛද්‍ය සැපයීම් අංශයට සැපයිය හැකි අයිතම පිළිබඳ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර සංස්ථාවට හා පොදුවේ ජාතික ආර්ථිකයට වඩාත් වාසිදායක කුමන මිලදී ගැනීමක් හෝ නිෂ්පාදනයක්ද යන්න පිළිබඳව විශ්ලේෂණාත්මකව ඇගයීම් කර නිෂ්පාදන මිශ්‍රණය තීරණය කර ඒ අනුව නිෂ්පාදනය සැලසුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඖෂධ සහ ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය නිෂ්පාදනය කර ඇසුරුම් කිරීමේදී එක් එක් අයිතමයන් වෙනුවෙන් සංස්ථාවේ වෙළඳ නාමය සහ රාජ්‍ය ලාංඡනය ඇතුළත් කර ලේබල් මුද්‍රණය කිරීම වෙනත් බාහිර ආයතන හරහා සිදු කරවාගෙන තිබුණු නමුත් ඒ පිළිබඳව නිසි අධීක්ෂණයක් හෝ පාලනයක් සංස්ථාව විසින් සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් සංස්ථාවේ වෙළඳ නාමයට හා කීර්තිනාමයට ගැටළු ඇතිවිය හැකි ආකාරයට ගුණාත්වයෙන් අඩු ඖෂධ සහ ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය වෙළඳපලට පිවිසීමට ඇති ඉඩකඩ අවුරා තැබීමක් සිදුවී නොතිබුණි. | මේ වන තෙක් සංස්ථාව ඒ පිළිබඳව පරීක්ෂාවක් සිදු නොකළ නමුත් මින් ඉදිරියේ සිට එසේ පරීක්ෂා කිරීමට කටයුතු කරන බව හා බාහිර ආයතනය මගින් මුද්‍රණය කරනු ලබන ලේබල් කිසියම් ආකාරයකින් තුන්වන පාර්ශවයක් වෙත නිකුත් කිරීම බලවත් වරදක් ලෙස සැලකීමට අදාළ කොන්දේසිය ඉදිරියේදී මුද්‍රණකරුවන් සමඟ ඇති ගිවිසුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | සංස්ථාවේ වෙළඳ නාමයට හා කීර්තිනාමයට ගැටළු ඇතිවිය හැකි ආකාරයට ගුණාත්වයෙන් අඩු ඖෂධ සහ ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය වෙළඳපලට පිවිසීමට ඇති ඉඩකඩ අවුරා තැබීම සඳහා ඒ පිළිබඳව නිසි අධීක්ෂණයක් හා පාලනයක් පවත්වාගෙන යා යුතුය. |
| (ඈ) | පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර සංස්ථාවට වඩාත් වාසිදායක මෙන්ම, අඩු පිරිවැයකට වෛද්‍ය සැපයීම් අංශයට සැපයිය හැකි අයිතම පිළිබඳව හා නිෂ්පාදන මිශ්‍රණය පිළිබඳව තීරණය කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. | 2019 වර්ෂය සඳහා සංස්ථාවේ නිෂ්පාදන සඳහා ලැබී තිබුණු මුළු ඇණවුම් ප්‍රමාණය ඒකක මිලියන 2,045.80 ක් වන බව, වර්ෂය අවසානය වන විට ඉන් ඒකක මිලියන 456.59 ක ප්‍රමාණයක් වෛද්‍ය සැපයුම් අංශය වෙත සැපයීමට නොහැකි වූ බව, සමාලෝචිත වර්ෂයේදී ඇණවුම් ලබා ගනු ලැබුවේ සංස්ථාවේ උපරිම ධාරිතාවයට අනුව බව හා ඉතිරිය බද්ධ ව්‍යාපාර හරහා දේශීයව නිෂ්පාදනය කර මිලදී ගැනීමට කටයුතු කිරීම නිසා එම ඖෂධ ආනයනයට වැයවන විශාල මුදලක් රජයට ඉතිරි කර දීමටද හැකි වූ බව. | පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර සංස්ථාවට වඩාත් වාසිදායක මෙන්ම, අඩු පිරිවැයකට වෛද්‍ය සැපයීම් අංශයට සැපයිය හැකි අයිතම පිළිබඳව හා නිෂ්පාදන මිශ්‍රණය පිළිබඳව තීරණ ගත යුතුය. |
| (ඉ) | පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් පිහිටුවීමේ අරමුණින් මිලදී ගෙන නවීකරණය කර තිබුණු ගොඩනැගිල්ල සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | 2017 හා 2018 වර්ෂයන්හිදී මෙම ගොඩනැගිල්ල සහිත ඉඩම මිලදී ගැනීමට හා ගොඩනැගිල්ල නවීකරණය සඳහා රු.මිලියන 131.39 ක් වැයකර තිබුණු අතර නවීකරණයෙන් පසු ගොඩනැගිල්ල 2019 අගෝස්තු 18 දින සංස්ථාව විසින් භාරගෙන තිබුණි. නමුත් විගණිත දිනය වූ 2020 මැයි 20 දින වන විටත් කිසිදු භාවිතයකින් තොරව නිශ්කාර්යව වසාදමා තිබුණු අතර ගොඩනැගිල්ල සඳහා අදාළ පළාත් පාලන ආයතනයෙන් ලබාගත යුතු අනුකූලතා සහතිකය (COC) පවා ලබාගෙන නොතිබුණි. | මෙම ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකය ලබා ගැනීම සඳහා අදාළ කටයුතු සිදුකරමින් පවතින බව. | අනුකූලතා සහතිකය ලබාගෙන ගොඩනැගිල්ල උපරිමයෙන් උපයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමකට අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කටයුතු අවසන් කිරීමෙන් පසුව හෝ රසායනාගාරය සහ පුහුණු පාසල පිහිටුවීම සඳහා සපුරාලිය යුතු අනෙකුත් අවශ්‍යතා කිසිවක් සඳහා සංස්ථාවේ පෙර සැලස්මක් හෝ සූදානමක් පවතින බව නිරීක්ෂණය නොවීය. | රසායනාගාරය හා පුහුණු පාසල ආරම්භ කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගෙන ඇති බව, ලියාපදිංචිය සඳහා අවශ්‍ය අනුමැතිය තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇති බව, මීට අමතරව මෙම ගොඩනැගිල්ල භාවිතා කළ හැකි වෙනත් ක්‍රම පිළිබඳව වාර්තාවක් කැඳවා ඇති බව, කෙසේ වෙතත් මෙම ගොඩනැගිල්ල මිලදී නොගත යුතුව තිබුණු බව පෞද්ගලික අදහස වන බව, නමුත් දැන් මෙය සංස්ථාවේ වත්කමක් බැවින් එය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත හැකි දැයි සොයා බැලීමට කමිටුවක් පත් කර ඇති බව හා එම කමිටුවේ නිර්දේශය මත මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. | ගොඩනැගිල්ල උපරිමයෙන් උපයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමකට අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 88.42 ක් වැයකර Cephalexin නිෂ්පාදනාගාරය නවීකරණය කර 2019 අගෝස්තු 09 දින කොන්ත්‍රාත්කරු විසින් සංස්ථාව වෙත භාරදී තිබුණු නමුත්, මෙම නිෂ්පාදනාගාරයේ නිෂ්පාදනය කිරීමට යෝජිත Cephalexin Capsules USP 250 mg ඖෂධය සඳහා යහපත් නිෂ්පාදන පරිචය පිළිබඳ සහතිකය (Good Manufacturing Practices) හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලබාගෙන නොතිබුණු බැවින් 2020 ජූලි 16 දින වන විටත් නිෂ්පාදන කටයුතු ආරම්භ කළ නොහැකිවී තිබුණි. | නවීකරණය කරන ලද නිෂ්පාදනාගාරය සංස්ථාව වෙත භාරදී තිබුණද එහි නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර කිසිවක් ස්ථාපිත කර නොතිබූ බැවින් යහපත් නිෂ්පාදන පරිචය පිළිබඳ සහතිකය සඳහා අයදුම් කිරීමට නොහැකි වූ බව. | නවීකරණයන් සඳහා වැය කරන ලද පිරිවැයට උපරිම ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි මෙහෙයුම් කටයුතු නිශ්චිත සැලසුමකට අනුව ක්‍රියාත්මක කළ යුතුය. |
| (උ) 2017 වර්ෂයේදී පිරිවැය රු.මිලියන 5.12 කට මිලදී ගෙන තිබුණු Phenoxymethyl penicillin Potassium BP 2015 අමුද්‍රව්‍යයෙන් කිලෝග්‍රෑම් 1,000 ක තොගය British Pharmacopia ප්‍රමිතීන්ට අනුකූල නොවීම නිසා තත්ත්වයෙන් අසමත්වී තිබුණි. එකී තත්ත්වයෙන් අසමත් තොග වටිනාකමින් සැපයුම්කරුගෙන් තවදුරටත් අයවිය යුතු රු.මිලියන 1.67 ක් අයකර ගැනීමට මෙම වාර්තාවේ දින වන විටත් අපොහොසත්වී තිබුණි. | මෙම අමුද්‍රව්‍ය තත්වයෙන් අසමත් වූ පසු රු.මිලියන 2.5 ක් රැඳවුම් මුදල් මගින් හිලව් කරගෙන ඇති බව, ඉතිරි මුදල දේශීය නියෝජිත ආයතනය විසින් ගෙවීමට එකඟවී ඇති බව හා මේ සම්බන්ධව ප්‍රසම්පාදන අංශය පසුවිපරම් (follow up) කරමින් පවතින බව. | අයවිය යුතු වටිනාකම නොපමාව අය කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

**2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) සංස්ථාවේ මාසික නිෂ්පාදන සහ ඇසුරුම්කරණ සැලසුම් ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේදී ඖෂධ වර්ග 45 ක් අතරින් ඖෂධ වර්ග 25ක අපේක්ෂිත නිෂ්පාදනය සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි. | නිෂ්පාදනාගාරයේ වාතයේ තිබිය යුතු පිරිවිතර නොතිබීම, නිෂ්පාදන කටයුතු හා ඇසුරුම් කටයුතු සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාවන් නොසිටීම, නිෂ්පාදනයේදී තාක්ෂණික ගැටළු පැන නැගීම, ටෙන්ඩර් ක්‍රියාවලිය නිසා වරින් වර අමුද්‍රව්‍ය වෙනස් | උපරිම නිෂ්පාදන කාර්යක්ෂමතාවයෙන් සහ ඵලදායීතාවයෙන් නිෂ්පාදනය කිරීම සඳහා තාත්වික නිෂ්පාදන සහ ඇසුරුම්කරණ සැලසුම් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වීමෙන් ඇතිවන තාක්ෂණික ගැටළු හා අමුද්‍රව්‍ය නියමිත වෙලාවට නොලැබීම වැනි විවිධ හේතු රාශියක් නිසා වාර්ෂිකව සැලසුම් කර තිබුණු සමහර ඖෂධ වර්ග නියමිත ප්‍රමාණයෙන් නිපදවිය නොහැකි වූ බව. | |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව විසින් නිෂ්පාදනය කර වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබුණු ඖෂධ වර්ග 38 න් වර්ග 20 ක් සඳහා වෛද්‍ය සැපයුම් අංශය විසින් ඇණවුම් කර තිබුණු සමස්ථ වාර්ෂික අවශ්‍යතාවයෙන් සියයට 80 ක් ඉක්මවා සැපයීමට අපොහොසත් වී තිබුණි. තවත් ඖෂධ වර්ග 13 ක් සඳහා වෛද්‍ය සැපයුම් අංශය විසින් ඇණවුම් කර තිබුණු සමස්ථ වාර්ෂික අවශ්‍යතාවයෙන් සියයට 50 ක් වත් සැපයීමට අපොහොසත්වී තිබුණි. | ප්‍රධාන වශයෙන් නිෂ්පාදනාගාරයේ වාතයේ තිබිය යුතු පිරිවිතර නොතිබීම නිසා නිෂ්පාදන කටයුතු අත්හිටුවීමට සිදු වීමත්, නියමිත සේවක සංඛ්‍යාව නොසිටීමත් නිසා සමස්ථ වාර්ෂික අවශ්‍යතාවය සැපයිය නොහැකි වූ බව, වෛද්‍ය සැපයුම් අංශයේ ඇණවුම් සඳහා නිෂ්පාදන අංශය මඟින් නිෂ්පාදනය කර අලෙවි අංශය වෙත ලබා දෙන ලද සියළුම තොග එදිනෙදා වෛද්‍ය සැපයුම් අංශය වෙත සැපයීම සිදු කරන බව. | වෛද්‍ය සැපයුම් අංශයේ ඇණවුම් සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහය ගනිමින් තම වෙළඳපල කොටස ආරක්ෂා කර ගත යුතුය. |
| (iii) | 2016 වර්ෂයේදී හඳුන්වා දී තිබුණු Tolbutamide Tablets BP 500 mg ඖෂධය සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනයකර නොතිබීම හේතුවෙන් ඒකක මිලියන 2 ක් වූ වෛද්‍ය සැපයුම් අංශයෙහි වාර්ෂික අවශ්‍යතා ඉල්ලුම සපුරාලීමට නොහැකි වී තිබුණි. | මෙම ඖෂධ මිලියන 02 ක ප්‍රමාණය 2018 වර්ෂයේදී නිෂ්පාදනය කර 2019 වර්ෂයේ මුලදී ඇසුරුම් කර ඇති බව හා වෛද්‍ය සැපයුම් අංශය මෙම ඖෂධ මිලදී ගැනීම දැනට සම්පූර්ණයෙන් අත්හිටුවා ඇති බව. | -එම- |
| (iv) | ඖෂධ නිෂ්පාදනාගාරය තුළ වාතයේ තිබිය යුතු පිරිවිතර නොතිබීම, නිෂ්පාදන කටයුතු සහ ඇසුරුම් කටයුතු සඳහා අවශ්‍ය සේවකයන් නොසිටීම, නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය හිඟවීම මෙන්ම සපයා ගැනීමට ප්‍රමාද වීම හා අවශ්‍ය ඇසුරුම් ප්‍රමාණවත් නොවීම යන හේතූන් මත වෛද්‍ය සැපයුම් අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇණවුම් කර තිබුණු ඖෂධවලින් විකුණුම් මිල රු.මිලියන 528.86 ක්වූ | නිරීක්ෂණය නිවැරදි බව හා 2020 වර්ෂයේදී නිෂ්පාදනය කරන ඖෂධ ප්‍රමාණය වැඩිකිරීම මඟින් මේ වන විට ඖෂධ නියමිත වෙලාවට වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා ඇති බව. | වෛද්‍ය සැපයුම් අංශයේ ඇණවුම් සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහය ගනිමින් තම වෙළඳපල කොටස ආරක්ෂා කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඖෂධ වර්ග 18 ක ඒකක මිලියන 408.23 ක් 2020 පෙබරවාරි 12 දින වන විටත් සැපයිය නොහැකිව් තිබුණි. | | |
| (v) | සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනය කර තිබුණු ඖෂධ වර්ගවල පෙති කුඩා කොටස්වලට කැඩී යාමේ හැකියාව ඉහළ යාම, ඖෂධ පෙතිවල බරෙහි ඇතිවූ විචලතා, අයහපත් පෙනුම හා ඖෂධ පෙති කැඩීමට ඇති වූ අපහසුතා වැනි හේතුන් මත නිෂ්පාදනය අතරමඟ නවතා නැවත නිෂ්පාදනය කිරීමට සිදුවීම හේතුවෙන් වැයවී තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 21.64 ක් විය. සෑම වර්ෂයකදීම නිෂ්පාදන ක්‍රියාවලියේ සිදුවන මෙම අයහපත් තත්ත්වයන් අවම කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඖෂධ නිෂ්පාදනයේදී ඇතිවන තාක්ෂණික ගැටළු මත ප්‍රතිනිෂ්පාදනය කිරීමට සිදුවන බව, ටෙන්ඩර් පටිපාටිය මත මිලදී ගන්නා අමුද්‍රව්‍ය වල ගුණත්වය නිතර විචලනය වීම මෙයට ප්‍රධාන හේතුව වන බව, සංස්ථාවට මෙම ගැටළු වලට නිරන්තරයෙන් මුහුන දීමට සිදුවන බව හා ඒ සඳහා අමතර පිරිවැයක් දැරීමටද සිදුවන බව. | ඖෂධවල ගුණාත්මක තත්ත්වය පහළ යාම හා නිෂ්පාදන ගැටළු අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (vi) | පර්යේෂණ මට්ටමේ පවතින ඖෂධ වර්ග 04 ක් සඳහා පිරිවැය රු.මිලියන 2.50 ක්වූ ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 224 ක් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු අතර විගණන දිනය වූ 2020 ජූලි 13 දින වන විටත් එම ඖෂධ වාණිජ වශයෙන් නිෂ්පාදනය කිරීමට අපොහොසත් වී තිබුණි. එම ඖෂධ පිළිබඳ පර්යේෂණ කටයුතු ආරම්භ කළ දිනයන්, අවසන් කළ දිනයන්, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු හා නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වීමට හේතු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. පර්යේෂණ සඳහා ඉකුත් වර්ෂයේදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.මිලියන 1.70 ක්වූ Flucloxaullin Sodium BP ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 200 | ඖෂධ 2 ක් ලියාපදිංචිය සඳහා ඖෂධ නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති බව, ඉතිරි අයිතම 2 තවදුරටත් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ මට්ටමේ පසුවන බව, Flucloxacillin Sodium BP අයිතමයද ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතින බව. | අලෙවි සැලැස්ම හා නිෂ්පාදන සැලැස්ම මත පදනම්ව අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ සැලැස්ම පිළියෙල කර අමුද්‍රව්‍ය මිලදී ගැනීමට කටයුතු කළ යුතු අතර නව ඖෂධ සඳහා වන පර්යේෂණ කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් භාවිතයකින් තොරව 2020 ජූලි 16 දින වන විටත් ඖෂධ අමුද්‍රව්‍ය ගබඩාවේ තබා තිබුණි. | | |
| (vii) | තත්ත්ව පාලන අංශයේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නිෂ්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලද නිමි ඖෂධ කිලෝග්‍රෑම් 5,466 ක් එම අංශය විසින් අනුමත කරන තෙක්ද, ඇසුරුම් අංශයේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නිමි ඖෂධ කිලෝග්‍රෑම් 2,355 ක් ඇසුරුම්කරණය කරන තෙක්ද, කර්මාන්තශාලාව තුළ ගොඩගසා තිබුණු බව 2019 ඔක්තෝබර් 23 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂණයේදී තහවුරු විය. | සාමාන්‍යයෙන් නිමි ඖෂධ පරීක්ෂා කිරීම සඳහා තත්ව පාලන අංශයට නිෂ්පාදන ක්‍රියාවලිය අවසන් වූ පසු දින 2– 3 ක් පමණ ගතවන අතර නැවත පරීක්ෂා කිරීමට සිදුවන අවස්ථාද ඇති බව, ඒ සඳහාද නැවතත් තත්වපාලන අංශය තුළ එම ඖෂධ විශ්ලේෂණ කටයුතු සිදුකිරීමට සිදු වන බව හා පරීක්ෂණ කටයුතු නිමවූ වහාම එම ඖෂධ තත්ත්ව පාලන අංශය මගින් අනුමත කරන බව. | උපරිම ධාරිතාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතුව නිෂ්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා තත්ත්ව පාලන අංශයේ සහ ඇසුරුම් අංශයේ ධාරිතාවයන් ඉහල නංවා ගත යුතුය. |
| (viii) | සංස්ථාවේ නිෂ්පාදනවල ගුණත්වය සම්බන්ධයෙන් මූලික වශයෙන් වගකිව යුතු තත්ත්ව පාලන දෙපාර්තමේන්තුව සඳහා 2019 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 30 ක් වුවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තත්ත්ව පාලන) තනතුර හා තත්ත්ව පාලන සහකාර තනතුරු 06 ක පුරප්පාඩු පිරවීමට අපොහොසත් වී තිබුණි. | පුරප්පාඩු වී ඇති මෙම තනතුරු පිරවීම සඳහා 2019 සැප්තැම්බර් 08 දින පුවත්පත් මගින් අයදුම්පත් කැඳවන ලද නමුත් මහ මැතිවරණය ප්‍රකාශයට පත් කිරීම නිසා එය කල් දැමීමට සිදුවූ බව හා මහ මැතිවරණයෙන් පසු එම තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරන බව. | තනතුරු පුරප්පාඩු පිරවීමට හැකි ඉක්මනින් කටයුතු කළ යුතුය. |
| (ix) | 2019 දෙසැම්බර් 31 දිනට අනුමත ඖෂධ නිමා කිරීමේ සහායකයින් සංඛ්‍යාව 29 ක් පමණක් වූ අතර ඉන් 02 දෙනෙකුගේ පුරප්පාඩු පිරවීමට අපොහොසත් වී තිබුණි. | මෙම පුරප්පාඩු 02 ක පිරවීම සඳහා 2020 පෙබරවාරි 20 දින පුවත්පත් මගින් අයදුම්පත් කැඳවා තිබුණු අතර මහ මැතිවරණය ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් බඳවා ගැනීමේ කටයුතු අත්හිටුවන ලද බව. | -එම- |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ වර්ග 41 ක ඒකක මිලියන 353.95 ක අලෙවි ඉලක්කයක් සපුරාගත නොහැකිවී තිබුණු අතර එම අපේක්ෂිත ඉලක්ක කරා ළඟා නොවීමේ ප්‍රතිශතය සියයට 06 සිට සියයට 92 දක්වා පරාසයක විහිදී තිබුණි. | වෛද්‍ය සැපයුම් අංශයේ ඇණවුම් සඳහා ප්‍රමුඛත්වය ලබාදී නිෂ්පාදනය කරන බව, අමුද්‍රව්‍ය හිඟය හා තාක්ෂණික දෝෂ යනාදි හේතූන් මත අලෙවි ඉලක්ක සපුරාගත නොහැකි වූ බව හා ඉදිරියේදී වෛද්‍ය සැපයුම් අංශයේ ඇණවුම් වලට අමතරව සංස්ථා නිෂ්පාදනයන් විවෘත වෙළඳපලට අඛණ්ඩව සැපයීම සඳහා අලෙවි ජාලය පුළුල් කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | වාර්ෂික අලෙවි සැලැස්මේ ඉලක්ක කරා ළඟා වීමට උපරිම උත්සාහය දැරිය යුතුය. |

**3.** **බද්ධ ව්‍යාපාර කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා යෝග්‍ය පෞද්ගලික ආයෝජකයන් අතර බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහාවූ යෝජනාව යටතේ සංස්ථාව විසින් විභව ආයෝජකයන් 17 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා 2018 හා 2019 වර්ෂයන්හිදී ගිවිසුම් ගතවී තිබුණි. 2019 වර්ෂය තුළදී එම බද්ධ ව්‍යාපාර සමඟ සංස්ථාව ගනුදෙනු සිදුකර තිබුණු ආකාරය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) බද්ධ ව්‍යාපාර පිහිටුවීම සඳහා වන අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව (Official committee) විසින් අදාළ ඖෂධ නිපදවන සමාගම් (Producer) සමඟ සංස්ථාව බද්ධ ව්‍යාපාර සඳහා ගිවිසුම් ගත විය යුතු බව නිර්දේශ කර තිබුණද, එම නිර්දේශයට පටහැනිව කටයුතු කරමින් ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය නිෂ්පාදනය කර සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයා හා අතරමැදි ආයතනයක් සමඟ සංස්ථාවේ සභාපති විසින් ත්‍රෛයිපාර්ශවීය ගිවිසුමකට එළඹ තිබුණි. | මෙම ආයතන සමඟ අත්සන් කළ ත්‍රෛපාර්ශවීය ගිවිසුම 2020 මැයි 30 දිනදී අවලංගුවී ඇති බව, මින් ඉදිරියේදී ඖෂධ නිපදවන සමාගම් (Producer) සමඟ පමණක් බද්ධ ව්‍යාපාර සඳහා ගිවිසුම් ගත වන බව හා බද්ධ ව්‍යාපාර මනා කළමනාකරණයකින් යුතුව පවත්වාගෙන යා හැකි ලෙසට ක්‍රමවේදයක් සකස් කරන බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. |
| (ii) අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව (official committee) විසින් නිර්දේශ කර තිබුණු පරිදි, බද්ධ ව්‍යාපාරය සඳහා ගිවිසගත් ආයෝජකයාගේ නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්ව පාලනය, කළමනාකරණය හා තාක්ෂණික සහාය සංස්ථාව විසින් සැපයිය යුතු අතර, ඒ සඳහා එම ආයෝජකයාගේ ව්‍යාපාරයේ | ආයෝජකයාගේ ව්‍යාපාරයේ කොටස්වලින් සියයට 10 ක් සංස්ථාව වෙත නිකුත් කළ යුතුවීම ආයෝජකයින් වෙත දැනුම් දී ඇති බව, බද්ධ ව්‍යාපාර නිෂ්පාදනයන් සඳහා තත්ත්ව පාලන පරීක්ෂණ සංස්ථාව හෝ කාර්මික තාක්ෂණික ආයතනය (ITI) වෙතින් සිදු කරන බව | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොටස්වලින් සියයට 10 ක් සංස්ථාව වෙත නිකුත් කළ යුතු විය. නමුත් සංස්ථාව වෙත කොටස් නිකුත්කර නොතිබුණු පෞද්ගලික සමාගම් දෙකකින් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 2,172.65 කට ඖෂධ අයිතම 15 ක් හා රු.මිලියන 42.41 කට ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතම 05 ක්ද සපයා ගෙන වෛද්‍ය සැපයුම් අංශය වෙත අලෙවි කර තිබුණි. එසේම එම පෞද්ගලික සමාගම් දෙකෙහි නිෂ්පාදන සම්බන්ධයෙන් ප්‍රමාණවත් තත්ත්ව පාලනයක්, කළමනාකරණයක් හෝ තාක්ෂණික සහායක් සංස්ථාව විසින් සපයා නොතිබුණි. | හා කළමණාකරන සහය පිළිබඳව සංස්ථාවේ නීතිඥ මඩුල්ල සමඟ සාකච්ඡා කර අදාළ ක්‍රියාමාර්ග ඉදිරියේදී ගැනීමට බලාපොරොත්තු වන බව. | |
| (iii) | බද්ධ ව්‍යාපාරය සඳහා ගිවිසගත් ආයෝජකයා විසින් නිෂ්පාදනය කරන ඖෂධවල නිෂ්පාදිත පිරිවැයට සියයට 20 ක ලාභ ආන්තිකයක් එකතු කර විකුණුම් මිල තීරණය කළ යුතු විය. සමාලෝචිත වර්ෂය තුළදී එවැනි එක් ආයෝජකයෙකුගෙන් සපයාගෙන වෛද්‍ය සැපයුම් අංශයට අලෙවිකර තිබුණු ඖෂධ අයිතම 11 ක මුළු නිෂ්පාදන පිරිවැය රු.මිලියන 614.26 ක්වී තිබුණි. ඊට රු.මිලියන 84.31 ක ලාභ එකතුකර ඉන්වොයිස් වටිනාකම රු.මිලියන 698.57 කට සංස්ථාව වෙත සපයා තිබුණි. සංස්ථාව විසින් එම ඉන්වොයිස් වටිනාකමට තවත් රු.මිලියන 57.87 ක සේවා ගාස්තු එකතු කර රු.මිලියන 756.44 කට වෛද්‍ය සැපයුම් අංශයට අලෙවි කර තිබුණි. එම ඖෂධ 11 හි මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 13.73 ක ලාභ ආන්තිකයක් ආයෝජකයා විසින්ද ඉන්වොයිස් මිලෙන් සියයට 8.28 ක සේවා ගාස්තුවක් සංස්ථාව විසින්ද උපයා තිබුණි. ඒ අනුව මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 23.15 ක් ලාභ හා සේවා ගාස්තු වශයෙන් එකතුකර විකුණුම් මිල තීරණය කර තිබුණි. | ඉදිරියේදී අදාළ ලාභ ආන්තිකයන් ඉක්මවා නොයන පරිදි කටයුතු කරන බව, මිල කමිටුවේ ප්‍රධාන සාමාජිකයකු වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (මුල්‍ය) විසින් විශේෂයෙන් මෙම ලාභාන්තිකයන් සහ අදාළ මිල ගණන් සම්බන්ධයෙන් විශේෂිත පරීක්ෂාවක් කරනු ලබන බව හා ඉන් පසු වෛද්‍ය සැපයුම් අංශයේ ගණකාධිකාරී විසින් තව දුරටත් පිරිවැය පත්‍රිකා යෝජනා කරන ලද මිල ගණන් සමඟ සසඳා අදාළ මිල ගණන් අනුමත කරන බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. |
| (iv) | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි, ඖෂධ හා වෛද්‍ය උපකරණ නිෂ්පාදනය කරන සමාගම් සමඟ පමණක් බද්ධ ව්‍යාපාරය පිහිටු විය යුතු වුවද, ශල්‍ය උපකරණ නිෂ්පාදනය නොකර බෙදාහැරීම පමණක් සිදු කරන පෞද්ගලික සමාගමක් සමඟ බද්ධ ව්‍යාපාරයක් සඳහා ගිවිසුම් ගත වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ආයෝජකයා විසින් ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතම 05 ක් අවස්ථා 08 කදී | මෙවැනි තත්ත්වයන් නැවත සිදු නොවන ලෙස කටයුතු කරන බව, ත්‍රෛපාර්ශවීය ගිවිසුම අවලංගු වූ බව හා මින් ඉදිරියේදී මෙවැනි අතරමැදියන් ගෙන් මිලදී ගැනීම් සිදු නොකරන බව, මෙම ක්‍රමවේදය ඉදිරියේදී පාරදෘශ්‍යභාවයෙන් යුතුව අධ්‍යයනය කිරීමට සංස්ථාව විසින් කමිටුවක් පත් කර ඇති බව හා එම කමිටුව විසින් මිල ගණන් පිළිබඳව දැඩිව අධ්‍යයනය කළ | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 35.02 කට වෙනත් සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන රු.මිලියන 7.39 ක අතරමැදි ලාභයක් තබාගෙන රු.මිලියන 42.41 කට සංස්ථාව වෙත සපයා තිබුණු අතර සංස්ථාව විසින්ද සේවා ගාස්තු වශයෙන් තවත් රු.මිලියන 2.67 ක් තබාගෙන රු.මිලියන 45.08 කට වෛද්‍ය සැපයීම් අංශයට සපයා තිබුණි. මෙම ආයෝජකයා විසින් ඉහත එක් අවස්ථාවකදී තවත් අතරමැදියෙකු හරහා සැබෑ නිෂ්පාදකයාගෙන් මෙම අයිතමය මිලදී ගෙන තිබුණි. මෙම සැබෑ නිෂ්පාදකයාගේ නිෂ්පාදන පිරිවැය පිළිබඳව සංස්ථාව විසින් කිසිදු විටෙක අවධානය යොමුකර නොතිබුණි. මෙම අතරමැදි ආයෝජකයා විසින් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 08 කදී සපයා තිබුණු ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය වෛද්‍ය සැපයීම් අංශය වෙත ලබාදී තිබුණු මිල පිළිබඳව සලකා බැලීමේදී, සත්‍ය නිෂ්පාදකයාගේ විකුණුම් මිලෙන් සියයට 56 සිට සියයට 115 දක්වා වූ පරාසයක ලාභ හා සේවා ගාස්තු අතරමැදි ආයෝජකයන් හා සංස්ථාව විසින් තබාගෙන තිබුණු බව අනාවරණය විය. | පසුව පමණක් මිල කමිටුව වෙත යොමු කිරීමට සැලසුම් කර ඇති බව හා බද්ධ ව්‍යාපාර රටට ලාභදායී වන බැවින් රටට විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර නව රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් බිහි කර ගත හැකිවී ඇති බව. | |
| (v) | ශල්‍ය උපකරණ නිෂ්පාදනය නොකර බෙදාහැරීම පමණක් සිදු කරන එම පෞද්ගලික සමාගම විසින් ඉහත (iv) හි සඳහන් ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතම සම්බන්ධයෙන් සංස්ථාව වෙත ඉදිරිපත් කරන ලද පිරිවැය පත්‍රිකා නිවැරදි නොවන බවත් ඒවා මුල් නිෂ්පාදකයාගේ සත්‍ය නිෂ්පාදන පිරිවැය ඇතුළත්ව පිළියෙල කර නොතිබුණු බවත් තහවුරු විය. සංස්ථාවේ කිසිදු වගකිව යුතු නිලධාරියෙකු විසින් එම පිරිවැය පත්‍රිකා නිවැරදි බවට තහවුරු කර ගැනීමට හා පිරිවැය පත්‍රවල ඇතුළත් දත්ත, ස්වාධීන පාර්ශවයකින් සහතික කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම කරුණ පිළිබඳව දැඩි අවධානයක් යොමු කර ඒ සඳහා වගකිව හැකි නිළධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කර පිරිවැය පත්‍රිකාවල නිවැරදි බව තහවුරු කිරීම සඳහා 2020 වර්ෂයේ සිට කටයුතු කරන බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. පිරිවැය පත්‍රිකාවල නිවැරදි බව ස්වාධීනව තහවුරු කර ගත යුතුය. |
| (vi) | මෙලෙස බද්ධ ව්‍යාපාරය සඳහා ගිවිසගත් ආයෝජකයා විසින් ලාභ හා ඊට අමතරව සංස්ථාව විසින් සේවා ගාස්තුද උපයා තිබීම හේතුවෙන් බද්ධ ව්‍යාපාරයක් ගොඩ නැගී නොතිබුණු අතරම අපේක්ෂිත පරිදි අවම පිරිවැයක් යටතේ ඖෂධ සපයා ගැනීමේ අරමුණද ඉටුවී නොතිබුණි. වෛද්‍ය සැපයීම් සඳහා රජය වැය කරනු ලබන මහජන මුදල් අතරමැදි සමාගම් කිහිපයක ආදායම් බවට පත්කිරීමේ ක්‍රියාවලියක් මේ හරහා | ඉදිරියේදී සියලු බද්ධ ව්‍යාපාර ආයතන වල පිරිවැය පත්‍රිකා ඉහතින් සඳහන් කමිටුව මගින් සම්පූර්ණ පරීක්ෂාවකට ලක්කර සියලු දුර්වලතා අවම කර මිල ගණන් අනුමැතිය සඳහා යොමු කරන බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාත්මක කර තිබුණි. බද්ධ ව්‍යාපාරවල ප්‍රධාන හවුල්කරුවූ සංස්ථාව විසින් මේ පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක්, මෙහෙයවීමක් හෝ පාලනයක් සිදු කර නොතිබුණි. | | |
| (vii) | ගිවිසුම් ගත ආයෝජකයා විසින් මිලදීගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු ශල්‍ය පරිභෝජන ද්‍රව්‍යවල එක් සැබෑ නිෂ්පාදකයෙක් සිය නිෂ්පාදන සඳහා ලබාගත යුතු යහපත් නිෂ්පාදන පරිචය (Good Manufacturing Practices (GMP)) පිළිබඳ සහතිකය සහ ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ බලපත්‍රයද ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙතින් ලබා ගෙන නොතිබුණි. තවත් එක් සැබෑ නිෂ්පාදකයෙක් සිය නිෂ්පාදන සඳහා ලබාගත යුතු යහපත් නිෂ්පාදන පරිචය (GMP) පිළිබඳ සහතිකය 2002 ජනවාරි 02 දිනද නිෂ්පාදන බලපත්‍රය 2010 නොවැම්බර් 20 දිනද ලබාගෙන තිබුණු නමුත් ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙතින් ඒවා යාවත්කාලීන කර ගෙන නොතිබුණි. | එක් සැබෑ නිෂ්පාදන ආයතනයක් සඳහා වූ යහපත් නිෂ්පාදන පරිචය (GMP) සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති නමුත් තවමත් ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) විසින් ඔවුන් වෙත එම සහතිකය නිකුත් කර නොමැති බව, අනෙක් සැබෑ නිෂ්පාදකයා වෙත නිකුත් කර ඇති GMP සහතිකයේ වලංගු කාලය අඛණ්ඩව පවත්නා බව. | බද්ධ ව්‍යාපාර සඳහා ගිවිසුම් ගත වූ ආයතන සඳහා යහපත් නිෂ්පාදන පරිචය (GMP) පිළිබඳ සහතික යාවත්කාලීනව පවත්වාගෙන යාම පිළිබඳව අධීක්ෂණය කළ යුතුය. |
| (viii) | බද්ධ ව්‍යාපාර වෙතින් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු ඖෂධ අයිතම 02 ක් සඳහා තත්ත්ව පරීක්ෂණ සිදුකර නොතිබුණු අතර ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතම 05 ක තත්ත්වය පරීක්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් සංස්ථාව සතු නොවීය. එම නිසා සැපයුම්කරුවන් විසින්ම එක් එක් නිෂ්පාදන කාණ්ඩවල සාම්පල් කාර්මික තාක්ෂණික ආයතනය (ITI) වෙත යොමු කර තිබුණු අතර එම ආයතනයෙන් නිකුත් කරන පරීක්ෂණ වාර්තා අනුව පමණක් ඖෂධවල තත්ත්වය සලකා බැලීම සිදු කර තිබුණි. ඒ අනුව බද්ධ ව්‍යාපාර යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයනු ලබන ඖෂධවල ගුණාත්වය පිළිබඳ ප්‍රමාණවත් ස්වාධීන තහවුරුවක් සිදුකර නොතිබුණි. | ඉදිරි සැපයීම් සිදුකිරීමේදී සංස්ථාව විසින් ලබා ගන්නා සාම්පල් කාර්මික තාක්ෂණික ආයතනය (ITI) මඟින් පරීක්ෂාවකට ලක් කර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව, බද්ධ ව්‍යාපාර සමඟ ඇතිකරගෙන තිබෙන ගිවිසුම් ප්‍රකාරව සසම්භාවී (අහඹු ලෙස) නියැදි පරීක්ෂා කරනු ලබන බව හා බද්ධ ව්‍යාපාර විසින් එකිනෙක සැපයුම සමඟ එවන විශ්ලේෂණ වාර්තා "Certificate of analysis" ඉතා සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කරනු ලබන බව. | බද්ධ ව්‍යාපාර යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයනු ලබන ඖෂධවල ගුණාත්වය පිළිබඳ ප්‍රමාණවත් ස්වාධීන තහවුරුවක් සිදු කළ යුතුය. |
| (ix) | බද්ධ ව්‍යාපාර ගත ගිවිසුම තුළ ඇතුළත්, සපයනු ලබන වෛද්‍ය සැපයුම්වල තත්ත්ව ආරක්ෂණය සහ පාලනය සම්බන්ධයෙන් වන 7.1 වගන්තියට අනුව, 2018 සහ 2019 යන වර්ෂවලදී බද්ධ ව්‍යාපාර ගිවිසුම් යටතේ ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය නිෂ්පාදනය කර සපයා තිබුණු සත්‍ය නිෂ්පාදන ආයතන දෙකෙහි | ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගන්නා බද්ධ ව්‍යාපාරය වෙත ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කරන ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය ලියාපදිංචි කිරීමේ සහතික සහ කාර්මික තාක්ෂණ ආයතනය මඟින් නිකුත් කරනු ලබන | බද්ධ ව්‍යාපාර යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයනු ලබන ඖෂධවල ගුණාත්වය පිළිබඳ ප්‍රමාණවත් |

| | | |
|---|---|---|
| නිෂ්පාදන ක්‍රියාවලිය හෝ නිෂ්පාදනවල ගුණත්වය පිළිබඳ කිසිදු භෞතික පරීක්ෂාවක් විගණිත දිනය වූ 2019 නොවැම්බර් 13 දින වන විටත් සංස්ථාව විසින් සිදු කර නොතිබුණි. ඒ අනුව සපයනු ලබන නිෂ්පාදනවල ගුණත්වය හෝ ඒවායේ නිෂ්පාදන ප්‍රමිතිය පිළිබඳව ප්‍රමාණවත් ස්වාධීන තහවුරුකර ගැනීමකින් තොරව සංස්ථාවේ වෙළඳ නාමයෙන් නිපදවා වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබුණි. | තත්ත්ව පරීක්ෂණ වාර්තාව පරීක්ෂා කරන බව හා බද්ධ ව්‍යාපාරවල නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව ප්‍රමාණවත් භෞතික පරීක්ෂාවන් සිදුකර එහි ගුණාත්මක භාවය තහවුරු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ස්වාධීන තහවුරුවක් සිදු කළ යුතුය. |
| (x) බද්ධ ව්‍යාපාරගත ගිවිසුමේ අංක 10 වගන්තිය ප්‍රකාරව, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී බද්ධ ව්‍යාපාර වෙත ඇණවුම් ප්‍රදානය කර තිබුණු වටිනාකම රු.මිලියන 824.95 ක්වූ ඖෂධ වර්ග 10 ක් සඳහා කාර්ය සාධන සුරක්ෂණ ලබාගෙන නොතිබුණි. | 2019 වර්ෂයට අදාළව එක් ආයතනයක් වෙත ගෙවීමට තිබුණු හිඟ මුදල් ප්‍රමාණයක් පැවතීම නිසා කාර්ය සාධන බැදුම්කරය ලබා දීමට සැපයුම්කරු කටයුතු කර නොතිබුණු බව, නමුත් ඖෂධ සැපයීමේ අවශ්‍යතාවය මත වෛද්‍ය සැපයීම් අංශය වෙත ඖෂධ සපයන ලද බව, මේ වන විට සෑම සැපයුමක් සඳහාම කාර්ය සාධන බැදුම්කරය ලබා ගනිමින් පවතින බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව හා බද්ධ ව්‍යාපාරගත ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. |

## 4. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුළු මුදල රු.මිලියන 118.58 ක් වැයකරමින් ඉදිකර 2018 ඔක්තෝබර් 12 දින විවෘත කර තිබුණු සිව්මහල් ගොඩනැගිල්ලේ පිපිරුම් සිදුවී තිබීම, විවිධ ස්ථාන තුළින් ගොඩනැගිල්ල තුළට වැසි ජලය කාන්දුවීම, ප්‍රමාණ පත්‍රවල සඳහන් ප්‍රමාණයන්ට වඩා අඩුවෙන් ඉදිකර තිබීම සහ ගෙවීම් කිරීමේදී ඒ පිළිබඳව නොසලකා එම අයිතමවලට අදාළ සම්පූර්ණ වටිනාකම් ගෙවීම වැනි විශාල අඩුපාඩු පැවති බව 2020 පෙබරවාරි 12 සහ ජූනි 01 යන දින දෙකෙහිදී සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. සංස්ථාව විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය වෙතින් 2020 ජූනි 12 දින ලබා ගෙන තිබුණු වාර්තාවට අනුව මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ප්‍රමිතිගත ඉදිකිරීම් පරිචයන් අනුගමනය කර නොතිබීම හේතුවෙන් එම අඩුපාඩු සිදුවී තිබුණු බව තවදුරටත් තහවුරු විය. | මෙම ගොඩනැගිල්ලේ අඩුපාඩු රාශියක් පවතින බව, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වෙතින් මේ පිළිබඳව වාර්තාවක් ලබා ගත් බව, එම වාර්තාව සහ විගණන වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සාධාරණ පරීක්ෂණයක් සිදු කර දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දීමෙන් පසු සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (ඉංජිනේරු) එම පරීක්ෂණය සඳහා පැමිණි බව, ඒ අතරතුර කොන්ත්‍රාත්කරු විසින් පැවති අඩුපාඩු නිවැරදි කර ඇති බව, ප්‍රමාණ පත්‍රවල සඳහන් ප්‍රමාණවලට වඩා අඩුවෙන් කර ඇති ඉදිකිරීම් පිළිබඳව උපදේශන සමාගම විසින් නැවත මැන මිල ගණන් ගැලපීමට සහ රඳවුම් මුදල්වලින් වැඩිපුර ගෙවූ මුදල් අඩු කරගැනීමට කටයුතු කරන බව සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දෙන තීරණය මත ක්‍රියා කිරීමට කටයුතු කරන බව. | කොන්ත්‍රාත් පරිපාලන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව විධිමත්ව සිදුකළ යුතු අතර මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

**5.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 සිට 2022 දක්වා වූ වර්ෂ 05 සඳහා පිළියෙල කර තිබුණු පස් අවුරුදු සංයුක්ත සැලැස්ම සම්බන්ධයෙන් හා 2019 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.2 ඡේදය ප්‍රකාරව, කාලච්ඡේදයන් තුළ ඉටුකරගත යුතු ක්‍රියාකාරකම්වල කාර්යසාධනය ඇගයීමට හැකිවන පරිදි කාර්යසාධන නිර්ණායක (Key Performance Indicators) ඇතුළත් කර සංයුක්ත සැලැස්ම පිළියෙල කළ යුතු වුවද, සංස්ථාව විසින් පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් සමහර ක්‍රියාකාරකම්වල කාර්යසාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව මෙන්ම මැනිය හැකි මට්ටමින් දක්වා නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 17 ක ප්‍රගතිය නිශ්චිතව ඇගයීමට නොහැකි විය. | අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය ඉදිරියේදී හැකි ඉක්මනින් ලබා දීමට කටයුතු කරන බව හා ඉදිරියේදී කාර්යසාධන නිර්නායක (KPI) ඇතුළත් කර සංයුක්ත සැලැස්ම පිළියෙල කරන බව. | අදාළ චක්‍රලේඛය හා මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 19 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඊට අමතරව තවත් ක්‍රියාකාරකම් 11 ක ප්‍රගතිය වාර්තාකර නොතිබුණු බැවින් හා තවත් ක්‍රියාකාරකම් 06 ක මූල්‍ය ප්‍රගතිය නොදක්වා භෞතික ප්‍රගතිය පමණක් දක්වා තිබුණු බැවින් එම ක්‍රියාකාරකම් 17 හි ප්‍රගතිය නිශ්චිතව මැනිය නොහැකි විය. | අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය හැකි ඉක්මනින් ලබා දීමට කටයුතු කරන බව. | අදාළ චක්‍රලේඛය හා මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iii) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ක කාලපරිච්ඡේදය තුළදී පිළියෙල කර තිබුණු සංයුක්ත හා ක්‍රියාකාරී සැලසුම්වලට අනුව, අලෙවි ජාලය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වූ විටෙක බෙදාහරින්නන් හා වරලත් අලෙවිකරුවන් හඳුනාගනු ලැබිය යුතු වුවද, එම කාලපරිච්ඡේදය තුළදී නව බෙදාහරින්නන් හා වරලත් අලෙවිකරුවන් හඳුනාගැනීමට අපොහොසත් වී තිබුණි. | සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීම සඳහා වූ JICA ව්‍යාපෘතිය හේතුවෙන් මෙම වර්ෂයන් තුළ ප්‍රමාණවත් පරිදි තොග නොමැතිවීම නිසා නව බෙදාහරින්නන් හෝ වරලත් අලෙවිකරුවන් බඳවා ගැනීමට කටයුතු නොකළ බව, 2020 වර්ෂය සඳහා නව බෙදාහරින්නන් බඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බව හා ඉදිරියේදී අලෙවි ජාලය පුළුල් කිරීමට කටයුතු කරන බව. | සංයුක්ත හා ක්‍රියාකාරී සැලසුම්වලට අනුව මෙහෙයුම් කටයුතු සංවිධානය කරගත යුතුය. |
| (iv) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ක කාලපරිච්ඡේදය තුළදී පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැසුම්වල 3.1.3 ක්‍රියාකාරකම ප්‍රකාරව, විධිමත් පරිදි වෙළඳපල පරීක්ෂණ හා සමීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | පුද්ගලික වෙළඳපල ඉල්ලුමට සරිලන සැපයීම සිදු කිරීම සඳහා ප්‍රමාණවත් තොග ඒකාකාරීව නොපැවතීම හේතුවෙන් අලෙවිය පිළිබඳ නිවැරදි වෙළඳපල තොරතුරු ලබාගැනීමට අපහසුවූ බව හා ඒ හේතුවෙන් අවශ්‍ය අවස්ථාවන්හිදි පමණක් වාචිකව එම තොරතුරු ලබාගැනීමට කටයුතු කරන බව. | -එම- |